# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1909/21 - 2015 අප්‍රේල් මස 07 වැනි අඟහරුවාදා - 2015.04.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (xii)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 (1) වන වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍ය, ආචාර්ය සරත් අමුණුගම වන මම, මේ නියමය මගින්, රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව පිහිටුවමින් ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද සහ 1984 ජනවාරි මස 24 වැනි දින අංක 281/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කලින් කල සංශෝධිත නියමය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, එහි උපලේඛනයේ I වන තීරයේ "පීඨය" යන ශීර්ෂය යටතේ සඳහන් "මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය" යන සටහනට අනුරූප වන්නා වූ II වන තීරයේ "අධ්‍යයන අංශය" යන ශීර්ෂය යටතේ වූ 6 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතම එකතු කිරීම මගින්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

"7. රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයන අංශය
8. ඉංග්‍රීසි භාෂා හා වාග් විද්‍යා අධ්‍යයන අංශය"

ආචාර්ය සරත් අමුණුගම,
උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍ය.

2015 අප්‍රේල් මස 01 වැනි දින,
කොළඹ දී ය.

04 - 713

1A - PG 2432 — 502 (2015/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.